# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1725/24 - 2011 සැප්තැම්බර් 30 වැනි සිකුරාදා - 2011.09.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ වලපනේ ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් නියම කොට ඇති පරිදි නියමිත කාලය තුළ දී දිවුරුම හෝ ප්‍රතිඥාව අත්සන් නොකිරීම හේතු කොටගෙන වලපනේ ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

සිසිර පුෂ්පකුමාර පතිරන නම් වූ සභිකයා අයත් වන එක්සත් ජනතා නිදහස් සන්ධානය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයකු වශයෙන් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ, ඒ පක්ෂයට අයත් ඒ වලපනේ ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තේරී පත්වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු නාම යෝජනා කිරීමට, ඉහත කී ආඥාපනතේ 65අ(2) වැනි වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද, ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු වන අන්නාඩි පෙරුමාල් රාජේන්ද්‍රම් මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

වලපනේ ප්‍රාදේශීය සභාවේ තේරීම් භාර නිලධාරී සමන් ශ්‍රී රත්නායක වන මම, (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, අන්නාඩි පෙරුමාල් රාජේන්ද්‍රම් මහතා වලපනේ ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

සමන් ශ්‍රී රත්නායක,
තේරීම්භාර නිලධාරී,
වලපනේ ප්‍රාදේශීය සභාව.

2011 සැප්තැම්බර් මස 21 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
නුවරඑළිය.

10-352

1A - G 15124— 365 (2011/09)

**(262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් නියම කොට ඇති පරිදි එහි හත්වන උපලේඛනය අනුව නියමිත කාලය තුළ දී දිවුරුම හෝ ප්‍රතිඥාව අත්සන් නොකිරීම හේතු කොටගෙන නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

අරුණ එම්. පී. ජයසිංහ නම් වූ සභිකයා අයත් වන ජනතා විමුක්ති පෙරමුණ නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයකු වශයෙන් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ, ඒ පක්ෂයට අයත් ඒ නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තේරී පත්වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු නාමයෝජනා කිරීමට, ඉහත කී ආඥාපනතේ 65අ(2) වැනි වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද, ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු වන ඊ. එම්. ජයතිලක මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී රත්නායක මුදියන්සේලාගේ ආනන්ද ලොකුබණ්ඩාර රත්නායක වන මම, (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, ඊ. එම්. ජයතිලක මහතා නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

ආර්. එම්. ඒ. එල්. රත්නායක,
තේරීම්භාර නිලධාරි,
නිකවැරටිය ප්‍රාදේශීය සභාව.

2011 සැප්තැම්බර් මස 21 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
කුරුණෑගල.

10-353

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.